# රැකියා හිඟය සහ ස්වයං රැකියාව

**ස්වයං රැකියාවක් ඇතිවීමේ තාර්කික පදනම නම් රටේ සමාජ-ආර්ථික ක්‍රමය තුළ ත මාගේ සේවය උරාගැනීමට තරම් ප්‍රමාණවත් ආර්ථික ප්‍රසාරණයක් නොමැත යන අදහස හෝ පවතින සමාජ-ආර්ථික ක්‍රමයේ වැටුප් ලබන සේවකයකු වීමට වඩා තමා ආරම්භ කළ ආදයම් උත්පාදන වැඩ සට හනක සේවයේ යෙදීම සාපේක්ෂ වශයෙන් වැඩි අදායමක් ලබාදෙන්නේය යන අදහස වේ.**

ස්වයං රැකියාව අද කාගේත් කථා බහට ලක්වූ මාතෘකාවකි. එක් අතකින් රජය ස්වයං රැකියා පිළිබඳව දැඩි උනන්දු වක් දක්වන අතර, රටේ ජනතාවගේ පැත්තෙන්ද මේ සඳහා විශාල උනන්දුවක් ඇති බව පෙනෙන්නට තිබේ. ජීවන බර දරාගැනීමට තරම් ලැබෙන වැටුප ප්‍රමාණවත් නොවීම නිසා රජයේ හෝ පුද්ගලික අංශයේ ස්ථිර රැකියාවල නියුතු අයද අර්ධකාලීන ස්වයං රැකියා මගින් අමතර ආදායමක් ලබාගැනීමට සිත් යොමු කර ඇති බවක් දක්නට ලැබේ. විවිධ ස්වේච්ඡා සංවිධානවලද යුගයේ මාතෘකාව බවට පත්වී ඇත්තේ ස්වයං රැකියාවන්ය. ස්වේච්ඡා ආයතනවලට ලැබෙන විදේශ ආධාර වලින් සැලකිය යුතු අනුපාතයක් ස්වයං රැකියා මූලික කොට ලබාගන්නා අතර, ස්වේච්ඡා සංවිධාන කටයුතුවල නිරතවීමෙන් ආදායමක් ලබාගැනීමද එක්තරා ආකාරයක ස්වයං රැකියාවක් බවට පත්වී තිබේ. රාජ්‍ය ප්‍රතිපත්තියක් වශයෙන් මෑතක සිට ක්‍රියාත්මක වන 'ජනසවිය' තුළද ස්වයං රැකියාවට ලැබෙන්නේ ප්‍රමුඛස්ථානයකි.

ස්වයං රැකියාව දෙස විවිධ දෘෂ්ටීන් ගෙන් බැලිය හැකිය. එකක් ආර්ථිකමය දෘෂ්ටියයි. අනෙක් සමාජ විද්‍යාත්මක දෘෂ්ටියයි. තුන්වැන්න දේශපාලනමය දෘෂ්ටියයි. තම තමා කැමති තවත් ඕනෑම දෘෂ්ටියකින් මෙය විග්‍රහකළ හැකි වුවද ස්වයං රැකියාව මේ ත්‍රිවිධ අංශයන් අනුව විස්තර කරන්නේ නම් එහි සියළු අංශයන් ආවරණය වන්නේ යැයි සිතිය හැකිය.

රැකියාව යනු රැකෙන ක්‍රමයයි. මේ නිසා ස්වයං රැකියාව යනු තම හැකියාව අනුව ආරම්භකරනු ලබන දෙයක් මත තමාගේ රැකියාව ගොඩනගා ගැනීම යන අදහස වේ. මේ අනුව ස්වයං රැකියාවක් ඇතිවීමේ පදනම වන්නේ කුමක්ද යන්න සොයා බලමු.

**ස්වයං රැකියාවක් ඇතිවීමේ තාර්කික පදනම නම් රටේ සමාජ-ආර්ථික ක්‍රමය තුළ තමාගේ සේවය උරාගැනීමට තරම් ප්‍රමාණවත් ආර්ථික ප්‍රසාරණයක් නොමැත යන අදහස හෝ පවතින සමාජ-ආර්ථික ක්‍රමයේ වැටුප් ලබන සේවකයකු වීමට වඩා තමා ආරම්භ කළ ආදයම් උත්පාදන වැඩසටහනක සේවයේ යෙදීම සාපේක්ෂ වශයෙන් වැඩි ආදයමක් ලබාදෙන්නේය යන අදහස වේ.**

---

පුහුණු හා සන්නිවේදන අංශ ප්‍රධාන
**අයි. රණසිංහ පෙරේරා විසිනි.**

---

මේ අනුව ස්වයං රැකියාවක යෙදෙන් නේ එක්කෝ ඔහුගේ සේවය උරාගැනීම ට තරම් ප්‍රමාණවත් ඉඩ ප්‍රස්ථා වන් ආර්ථිකය තුල නැති නිසාය. නැත හොත් ස්වයං රැකියාවක යෙදීම මගින් වෙනත් රැකියාවක යෙදීමට වඩා සාපේක්ෂ වශයෙන් වැඩි ආදායමක් ලබා ගත හැකි වන නිසාය.

මෙරට ස්වයං රැකියාවල තාර්තික පදනම වී ඇත්තේ කුමක්ද යන්න අප කව්රුත් සිතාබැලිය යුතුය. ශ්‍රී ලංකාවේ ස්වයං රැකියාවල රහස අප කාටත් පැහැදිළිය. අපේ ජනතාව ස්වයං රැකියා ක්ෂේත්‍රයට තල්ලුකර දමුවේ එවැනි ස්වයං රැකියාවල යෙදීම වැඩි ආදයම් ලබාදෙන නිසා නොවේ. කිසිවක් නොකර සිටිනවාට වඩා යමක් කිරීම සුදුසු බැවිනි. නැතහොත් කිසියම් හෝ ආදායමක් ලබාදෙන කාර්යයක නොයෙදී තව දුරටත් ජීවත්වීම අපහසු වූ බැවිනි.

ධනවාදී ආර්ථික ක්‍රම වර්ධනය වී ඇති රටවල රටේ ජනතාවට වැඩිපුර රැකියා සපයන්නේ පුද්ගලික අංශය මගිනි. කෘෂිකර්ම, කර්මාන්ත, ප්‍රවාහන සංනිවේදන ආදී විවිධ ක්ෂේත්‍ර වල නියමුවන් වී ඇති සමාගම් රටේ ජනතාවට රැකියා ලබාදෙති. මෙවැනි රටවල රජයේ මැදිහත්වීම ඉතාමත් සීමා සහිතය. සමාජවාදී ආර්ථික ක්‍රම ඇති රටවල රැකියා සැපයීමේ වගකීම රජය භාරගනී. කෘෂිකර්මය, කර්මාන්ත හා ඉහතකී සියළුම නිෂ්පාදන අංශවල අයිතිය රජය වෙත පැවරී ඇති අතර ජනතාව සේව යෙහි යෙදවීමේ කාර්‍යයද රජය වෙතම පැවරී ඇත. එහෙත් තුන්වැනි ලෝකයේ බොහොමයක් රටවල මෙන්ම අප රට තුලද සිදුවන්නේ ඉහත කී පුද්ගලික අංශය තුලින් හෝ රාජ්‍ය අංශය තුලින් හෝ ප්‍රමාණවත් තරම් සේවා ඉඩ ප්‍රස්ථා මතු නොවීමය. මෙහි ප්‍රතිඵලය වී ඇත්තේ තම තමාගේ රැකියා ගැන තම තමාම වගබලා ගතයුතු තත්ත්වයකට අපේ ජනතාව පත්වීමයි.

අපේ රටේ වැඩ කරන ජනතාවගෙන් බොහොමයක් ස්වයං රැකියාවල නියුක්ත වූවෝ යයි කිවහොත් ඔබ පුදුම විය හැකිය. එහෙත් සත්‍ය වන්නේ එයයි: ''ස්වයං රැකියාව'' අද යුගයේ මාතෘකාව වී ඇතත් අපි ජාතියක් වශයෙන්ම ස්වයං රැකියාවන්හි නියුක්ත වූවෝ වෙමු: මෙරට ජනතාවගෙන් 65% ක් කෘෂි කර්මයේ යෙදී සිටිති. මින් බහුතරයෙහි රැකියාව ස්වයං රැකියාවයි. අනුන්ගේ ඉඩම් බදු පිට හෝ කුලී පිට වගා කොට වැටුප් ශ්‍රමිකයන් වශයෙන් ජීවත් වන ගොවිජනතාව හැරුණුවිට හේන් ගොවීන් එළවළු ගොවීන්, වී ගොවීන් ආදී අනෙක් සියළුම ගොවීන්ගේ ස්වාමියෝද ඔව්හුම වෙති. ප්‍රාග්ධනයේ අයිතිකරුවෝද, යෙදවුම් තීරණ ගනු ලබන්නෝද, සේවය සපයන්නෝද, අවසන් වශයෙන් ආදායම් ලබන්නෝද, වන්නේ මේ ගොවීන්මය. මේ නිසා අපේ ගොවීන් දැනටමත් ස්වයං රැකියාවල නිරතවී ඇත.

හැම ගමකම පාහේ වඩුවෙකු හෝ වඩුවන් කීප දෙනෙකු සිටී. මේෂන් වරුද එසේය. සත්ව පාලනයෙහි

යෙදෙන්නෝද, රෙදි සෝදන්නෝද, වළං තනන්නෝද, බෙර වයන්නෝද, කොහු ඉදල් සාදන්නෝද යෙදී ඇත්තේ ස්වයං රැකියාවල මිස රජයේ හෝ සමාගමවල රැකියාවන්හි නොවේ. මීට අමතරව ස්වයං රැකියා සේ නොසැලකුවත් ගස් නගින්නෝද, ගල්කඩන්නෝද, වෙනත් විවිධ දෛනික වැටුප් මත යෙදී ඇති කුලී කරුවෝද ආර්ථිකයෙහි එදිනෙද අවශ්‍යතාවයන්හි නියුක්තව සිටී. අපේ ගමක් තුල තිබෙන මේ කිසිදු ආර්ථික කාර්යයක් (ස්වයං රැකියාවන්) රජය විසින් හෝ සමාගම් විසින් හෝ ස්වෙච්ඡා සංගම් විසින් හෝ ඇතිකළ ඒවා නොවේ. ඒවා හුදෙක් සමාජ-ආර්ථික ක්‍රමයේ අවශ්‍යතාවන් උඩ තීරණය වූ ඒවා වන අතර ඒවාට ස්වයං රැකියා කියා හෝ එසේ නොවේ යැයි කියා හෝ නම් තැබීම පිටස්තරයන්ට කළහැකිය. කෙසේ වුවත් තමා ආරම්භ කළ දෙයක් මත තමාම සේවයේ යෙදී සිටින නිසා කුලී කරුවන් හැර අන් සියළු ගැමියන් ස්වයං රැකියාවල යෙදී ඇති බව අපට නිගමනය කළ හැකිය. ගමක්තුල රජයේ හෝ පුද්ගලික අංශයේ සේවා සඳහා ශ්‍රමය සපයන වැටුප් ශ්‍රමිකයන් ඉතා අඩුය. බහුතරය හැමවිටම මෙවැනි ස්වයං රැකියාවල නියුක්ත වූවෝ නිසා ස්වයං රැකියාව අපට අළුත් දෙයක් නොවන බව සිහි තබාගත යුතුය.

ලංකාවේ ග්‍රාමීය ආර්ථිකය බෙහෙවින්ම ස්වයං රැකියා පදනමක් බවට පත්ව තිබියදී නව තවත් සමවර්ගයේ ස්වයං රැකියාවලට ජනතාව යොමු කිරීම රාජ්‍ය හා පෞද්ගලික අංශයේ නොහැකියාව ප්‍රදර්ශනය කිරීමකි. බොහෝ ස්වයං රැකියා ආරම්භ වන්නේ දූනටමත් පුද්ගලයන් නියුක්තවී සිටින අංශ වලමය. මේ නිසා නව ස්වයං රැකියා දූනට ස්වයං රැකියාවල නියුක්ත වූවන්ට තර්ජනයක් වූ අවස්ථාද වාර්තා වී තිබේ. බොහොමයක් ස්වයං රැකියා කොසු ඉදල් නිපදවීමටත්, කඩල රටකජු තම්බා විකිණීමටත්, විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය කිරීම යයි කියා, ඉතා අඩු වෙළඳපලක් ඇති හෝ නිෂ්පාදනවලින් දූනටම වෙළඳ පල තෘප්තවී ඇති අංශවල නියුක්ත වීමටත්, ලොතරැයි ටිකට් විකිණීමටත් එසේ නොමැති නම් අතරමැදි සේවා නිෂ්පාදන කාර්යයවල යෙදීමටත් සීමාවී ඇත. මේ බොහොමයක් අංශවලට



ගොවිතැනද ස්වයං රැකියාවක් වශයෙන්

ප්‍රමාණවත් වෙළඳපලක් නැත. වෙළඳ පලක් ඇති කරගැනීමට නම් දූනට නිෂ්පාදනයේ යෙදී ඇති ස්වයං රැකියා කරුවකුගේ වෙළඳපල හා තරඟකොට එම වෙළඳපල අල්වාගත යුතුය. නැත හොත් ඔහුටත්, ප්‍රමාණවත් නොවන තමාටත් ප්‍රමාණවත් නොවන ආදායම් මට්ටමක් ලබාගනිමින් ස්වයං රැකියාව ආයාසයෙන් තල්ලුකරගෙන යා යුතුය. ස්වයං රැකියාවල යෙදුනු අයගෙන් වැඩි දෙනෙක් තමා යෙදවූ කුඩා පරිමාන ප්‍රාග්ධනයද අහිමිකර ගනිමින් මාස ගණන කින් හෝ වසරකින් දෙකකින් පමණ රැකියාවට ආයුබෝවන් කියති. ශ්‍රී ලංකාවේ අත්දැකීම් අනුව ස්වයං රැකියා බොහොමයක් අවදනම් සහිත වූත්, අස්ථිර වූත්, අකාර්යක්ෂම වූත් උත්සායන් බවට පත්වී තිබේ.

ජපානය වැනි දියුණු රටවල ''ස්වයං රැකියා'' සේවා නියුක්තියෙහි ප්‍රධාන තැනක් ගෙන ඇත. එහෙත් ජපානයේ ස්වයං රැකියාත්, අපේ ස්වයං රැකියාත් අතර සැළකිය යුතු වෙනසක් දක්නට ලැබේ. ජපානයෙහි බොහෝ ස්වයං රැකියාවල ස්වභාවය යම් යම් විශාල සමාගම් වල නිෂ්පාදන කාර්යයන්ට තම ගෘහයේ සිට හවුල්වීමයි. තම තමන්ගේ නිවෙස්වල සිටම විශාල වෙළඳ සමාගම් වලට අවශ්‍යවන නිෂ්පාදන කොටස් පවුලේ සාමාජිකයන් විසින් නිමකිරීම මෙහිදී දක්නට ලැබේ. මේ ගෘහ නිෂ්පාදකයන්ට වෙළඳපල පිළිබඳ ප්‍රශ්නයක් නැත. මිල පිළිබඳ ප්‍රශ්නයක් ද නැත. මේ නිසා අවදානමක් නොමැත. පිලිපීනයේද මෙවැනිම ස්වයං රැකියා වැඩසටහන් පවත්වාගෙන යති. පිලිපීනයේ සපත්තු නිෂ්පාදනය කරන විශාල සමාගම් එම සමාගම්වල නිෂ්පාදන ලබාගන්නේ ඔවුන්ගේ කුඩා කොන්ත්‍රාත්තු ඉටුකරන නිවෙස් වලිනි. සමාගමේ ප්‍රධාන කාර්ය බවට පත්ව ඇත්තේ ලේබල් යෙදීමත්, නිමි භාණ්ඩ, ලෙස නිෂ්පාදිතයන් වෙළඳපලට ඉදිරිපත් කිරීමත් පමණි. මේ නිසා විශාල සමාගම් වල වියදම්ද අඩුය. ඔවුන්ට කර්මාන්ත ශාලා පිහිටුවීමට විශාල ඉඩකඩම් ලබාගැනීම අවශ්‍ය නොවේ. විශාල ගොඩනැගිලි අවශ්‍ය නොවේ. කම්කරු ප්‍රශ්නද පැන නොනගී. සියල්ලෝම කාර්යක්ෂමව වැඩෙහි නියුක්ත වී සිටී. වෙළඳපල සොයා ගැනීමත්, අමුද්‍රව්‍ය සොයා ගැනීමත් සමාගමේ වගකීම වේ. සමාගම් විසින් අමුද්‍රව්‍ය ලබාදුන් විට ශ්‍රමය යොදවා භාණ්ඩ නිපදවා සමාගමට අලෙවිකිරීමට මේ ස්වයං රැකියා කරුවන්ගේ කාර්යයයි.

(23 වන පිටුවට)

**රැකියා හිඟය .....**

(15 වන පිටුවෙන් ඉතිරි)

එහෙත් අපේ ස්වයං රැකියා කරුවන්ට අමුද්‍රව්‍ය සෙවීමත්, නිෂ්පාදනයේ යෙදීමත් වෙළඳපල සෙවීමත් යන සියල්ලම තමා විසින්ම කිරීමට සිදුවී තිබේ. මීට අමතරව නිදහස් වෙළඳාම මත සිදුවන ආනයන භාණ්ඩ වල තර්ජනයටත්, නිරතුරුව සිදුවන මිල උච්චාවචනයටත් මුහුණදෙන මොවුන්ගේ ස්වයං රැකියාවලින් කල් පවතින්නේ කීපයක් පමණි. ගෙවතු වගාව, කුඩා පරිමාන සත්ව පාලනය වැනි ඉතා අඩු ආදායම් මට්ටම් මත පවත්වා ගෙන යන ස්වයං රැකියා කීපයක් හැරුණු විට අළුතින් බිහිවන ස්වයං රැකියා කරුවන්ගේ නිෂ්පාදනයන් දිගු කාලීනව තහවුරු වන්නේ නම්, එසේ වන්නේ එම නිෂ්පාදනයෙහි යෙදුනු වෙනත් අකාර්යක්ෂම ස්වයං රැකියා කරුවකුගේ වෙළඳපල අල්වා ගැනීමෙනි.

ශ්‍රී ලංකාවේද ඇතැම් සමාගම් දියුණු රටවල ක්‍රියාත්මක වන වර්ගයේ ස්වයං රැකියා ජනිත කිරීමට දූන් දූන් කටයුතු කරනු ලැබේ. උදහරණයක් වශයෙන් කුකුල් පාලනය සඳහා පැටවුන් හා ආහාර, බෙහෙත් ආදිය ලබාදෙමින් යම් නියමිත මිලකට සත්ව නිෂ්පාදන ලබා ගැනීමට මොවුහු ක්‍රියාකරති. මේ අනුව වෙළඳපල අවිනිශ්චිතතාවත්, මිල උච්චාවචනයත් වලක්වා ගැනීමට ස්වයං රැකියා වල යෙදෙන්නන්ට හැකිය. කෙසේ වුවද නිෂ්පාදනයේ ප්‍රතිලාභවලින් වැඩි අනුපාතයක් සමාගම් වෙත ගලායාම මින් වැලැක්විය නොහැකිය.

ස්වයං රැකියා සැම දෙනාටම ආරම්භ කළ නොහැකිය. ස්වයං රැකියාවක් සාර්ථකව පවත්වාගෙන යාමට පුද්ගලයා තුල හොඳ ව්‍යවසායකත්වයක් තිබිය යුතුය. වෙළඳපල ගැනත් වෙළඳපලේ මිළ මට්ටම් ගැනත්, වියදම් අවම කිරීමේ මාර්ග ගැනත්, තරඟ කරන්නේ කෙසේද යන්න ගැනත් අවබෝධයක් නැති අයෙකුට ස්වයං රැකියාවක් පවත්වාගෙන යා නොහැකිය. එවැනි හැකියාව නොමැති අය කළ යුත්තේ දක්ෂ ව්‍යවසාය කත්වයන් ඇති අයෙකුට තම ශ්‍රමය විකිණීම මිස තමාද ව්‍යවසායකත්වය භාරගැනීමෙන් අතරමං වීම නොවේ. රැකියා නැතිකමට ස්වයං රැකියාව පිළිතුරක් සේ සැලකුවත්, ස්වයං රැකියාව හැමදෙනාටම සුදුසු රැකියාවක් නොවේ. රැකියා නැති සැම දෙනාම ස්වයං රැකියා වක නියුක්තවිය යුතු යයි කීම ප්‍රායෝගික ලෝකයේ ක්‍රියාත්මක කළ නොහැක්කකි.